සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

## පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

# "අදිති"

7

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**01. ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සමහර ළමයි වෙරළේ ඇවිදිමින් සිප්පි කටු, කවඩි, හක්කැට හා බට්ටන් අවුල අවුලා ඔඩොක්කුවල පුරවා ගනිති. නැත්තම් කොට්ට උරවල දමා ගනිති. බට්ටා කවුරුත් අඳුනති. එය හැඩහුරුකමින් හා පාටින් ද සියඹලා ඇටයක් වැන්න. එසේ වුව ද බට්ටා සියඹලා ඇටයකට වඩා ලොකු ය. බට්ටෝ ගඟබඩවල ගස්වල එතෙමින් දුවන වැල්වල හට ගන්නා ඇට වගයකි. බට්ටන් මූදට ලැබෙන්නේ කෙසේ ද? නටු පර වීමෙන් හෝ සුළඟින් හෝ ගිළිහී වැටෙන බට්ටෝ ගඟේ පාවෙති. ගඟේ වතුර මුහුදට වැටෙන කල බට්ටෝ ද ඒ සමඟ නැවත මුහුදට වැටෙති. මුහුදේ වැටුණු කල රළ බිඳ වැටීම නිසා බට්ටෝ වෙරළේ ගොඩ ගැසෙති.

1. ළමයි වෙරළෙන් අහුලා ගන්නේ මොනවාද? ..............................................................

2. ඒවා අවුලා පුරවා ගන්නේ මොනවාට ද? ..............................................................

3. බට්ටන් යනු කවරෙක් ද? ..............................................................

4. මෙහි සඳහන් උපමාවක් ලියන්න. ..............................................................

5. **'බට්ටෝ වෙරළේ ගොඩ ගැසෙති'**

   ඉහත වාක්‍ය ඒක වචනයට හරවා ලියන්න..............................................................

6. කෙටි ඉස්පිලි දෙකක් සහ දික් ඉස්පිල්ලක් එක ළඟ යෙදුණු වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. ..............................................................

7. **'සියඹලා'** ඉරි ඇඳි අකුර හඳුන්වන්න. ..............................................................

9. ගඟ අසල යන අර්ථය දෙන වචනය ඡේදයෙන් සොයා ලියන්න.

   ........................................

10. **'වැටුණු'** යන පදය කුමන කාලයකට අයත්වේද?...........................................

**02. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට අදාළ වචනය වරහන් තුළින් තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.**

i. මම ඊයේ .............................(පුස්තකාලයෙන්/පුස්ථකාලයෙන්) අලුත් පොතක් ගෙනාවෙමි.

ii. ..............................(දෘශ්‍යබාධිත/දෘෂ්‍යාබාධිත) වුව ද ඔහු එදිනෙදා වැඩ කටයුතු තනිව ම කර ගත්තේ ය.

**03. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු අතීත කාල ක්‍රියා පදය වරහන තුළින් තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.**

i. මිනිස්සු දිවා රෑ වැඩෙහි ........................ (නිරත වෙති./නිරත වූහ.)

ii. ළමයි ගුරුවරුන්ගේ අවවාද ...................... (පිළිගත්තෝ ය./ පිළිගනිති.)

**04. පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.**

i. මඩේ හිටවපු ............................................ වගේ.

ii. කළුවා ................................................ ගියා වගේ.

**05. සුදුසු විරාම ලකුණු යොදන්න.**

i. සීයේ මම කියන්න ද බින්දු කිව්වේ ය

ii. අර තනි කකුලේ මේසයක් කවීෂා කීවා ය

**06. වචන අර්ථවත් ලෙස ගළපා වාක්‍ය ලියන්න.**

i. පේර / මී පැණි / ම / රස ය / මී / ඇඹුල්

.................................................................................................................

07\. i. **පහත සඳහන් වාක්‍යයේ උක්ත පදයට යටින් ඉරක් අඳින්න.**

සීයා කුඹුර කොටයි.

ii. **පහත සඳහන් වාක්‍යයේ කර්ම පදයට යටින් ඉරක් අඳින්න.**

තාත්තා ඉන්නක් කැපුවේ ය.

**08. පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.**

i. අස්සක් - .......................

ii. අරුම - .......................

**09. පහත සඳහන් වචනවල ඉරි ඇඳි පිල්ලමේ නම ලියන්න.**

i. <u>රූ</u>කඩ - .......................

ii. <u>කෘ</u>මීන් - .......................

**10. පහත සඳහන් වගන්තිවල ඉරි ඇඳි වචනයේ අර්ථය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

i. ඇය උදෑසන හයට පාසල **<u>අභිමුව</u>**ට එන්නී ය. (අකලට /ඉදිරියට)

ii. සෑම අඩි පාරක් ම මිනිසා පිළිබඳ **<u>ස්මරණය</u>** රැගෙන යන්නේ ය. (මකතය/සටහනක්)

**11. පහත සඳහන් ඉංග්‍රීසි වචනවල අර්ථය සිංහලෙන් ලියන්න.**

i. Clouds - .............................

ii. library - .............................

**12. සිංහල වචනය සඳහා ගැළපෙන ඉංග්‍රීසි වචනය අකුරෙන් ලියන්න.**

i. රියදුරු - .............................

ii. එළදෙන - .............................

**13. හිස්තැනට ගැළපෙන වචනය වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

How many flowers ..........................( is/ are ) there.

**14. දෙමළ වචනයේ අර්ථය සිංහලෙන් ලියන්න.**

**කුඩියුංගල්** - .........................................

**15. පහත සඳහන් වාක්‍ය දෙමළ බසින් කියන ආකාරය සිංහල ලියන්න.**

කට සෝදන්න - .....................................

- **පිළිතුරු සපයන්න.**

16. දසදහස් විසි පහ ඉලක්කමෙන් ලියන්න. ..................................................................


17.

| | |
|---|---|
| 6 | 0 |
| 3 | 9 |

කොටුව තුළ ඇති සංඛ්‍යා යොදාගෙන සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව හා විශාල ම සංඛ්‍යාව පිළිවෙළින් ලියන්න.

......................................................................

18.




i. මෙම රූපයේ පාට නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. .........................

ii. පාට කළ කොටස රූපයෙන් කවර භාගයක් ද? .................................

19. iii v vii ......... xi .......... මෙම සංඛ්‍යා රටාවේ හිස්තැන්වලට එන සංඛ්‍යා රෝම සංඛ්‍යාවෙන්ම ලියන්න

20. A, B හා C විවිධ බරෙන් යුත් පාර්සල් තුනකි. ඒ අනුව,




i. පාර්සල් තුනේ ම බර කොපමණ ද? ...........................................

ii. A හා C පාර්සල් දෙකෙහි බරෙහි වෙනස කීය ද? ..........................................

21. සටහන අනුව හම්බන්තොට සිට කොළඹට දුර කිලෝමීටර කීයද? ..............................

| | මාතර | ගාල්ල | කොළඹ |
|---|---|---|---|
| ගාල්ල | | | 116 |
| මාතර | | 42 | 161 |
| හම්බන්තොට | 77 | 122 | ........... |

22. පහත දී ඇති හිස්තැන් පුරවන්න.


| ඝනවස්තුව | මුහුණත් ගණන | ශීර්ෂ ගණන | වක්‍ර දාර ගණන | සරල දාර ගණන |
|---|---|---|---|---|
| ඝනකය | 6 | 8 | නැත | ............ |
| සිලින්ඩරය | ............ | නැත | ............ | නැත |
| චතුස්තලය | 4 | ............ | නැත | ............ |

23. රෙදි පටියක් හරි මැදින් දෙකට කපා ඉන් එක් කොටසක් නැවත කැබලි තුනකට කපන ලදී. කුඩා කැබැල්ලක දිග 5cm නම්, මුලින් තිබු රෙදි පටියේ දිග කොපමණ ද?

..........................................


24. i. A භාජනය පිරවීමට B භාජනයෙන් කී වරක් ජලය දැමිය යුතු ද? ..............................

ii. A හා B භාජනවල පරිමාව අතර වෙනස කොපමණ ද? ..........................................





25. වගුව ඇසුරින් ප්‍රස්තාරයත්, ප්‍රස්තාරය ඇසුරින් වගුවත් සම්පූර්ණ කරන්න.

| ආහාරය | කැමති සිසුන් ගණන |
|---|---|
| බත් | 10 |
| පාන් | 6 |
| පිට්ටු | ......... |




26. දී ඇති පාද තුන ම සමාන ත්‍රිකෝණයේ සහ සෘජුකෝණාස්‍රයේ සමමිතික රේඛාව බැගින් අඳින්න.



27.

| **ද්‍රව්‍ය** | **1kg මිල** | | **ප්‍රමාණය** | **මුදල** | |
|---|---|---|---|---|---|
| | **රුපියල්** | **සත** | | **රුපියල්** | **සත** |
| සීනි | **94** | **00** | 1kg | **94** | **00** |
| පරිප්පු | **120** | **00** | 500g | **A...........** | **.......** |
| සහල් | **60** | **00** | 2kg | **120** | **00** |
| කිරිපිටි | **1000** | **00** | B............. | **400** | **00** |
| තේ කොළ | **520** | **00** | 500g | **C...........** | **.......** |
| | | | මුළු මුදල | **D...........** | **.......** |

i. ඉහත දැක්වෙන වගුවේ A,B,C,D හිස්තැන් පුරවන්න

ii. ඉහත සඳහන් පරිදි ද්‍රව්‍ය මිල දී ගෙන වෙළෙන්දාට රු 1000.00 නෝට්ටුවක් දුන් විට ලැබෙන ඉතුරු මුදල කීය ද? රුපියල් ............... සත .......................

❖ **ප්‍රශ්න හොඳින් කියවා සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

28. පෙති හතරක් ඇති මලක් නොවේ.
    1) නා    2) අශෝක    3) ඇට්ටේරියා

29. කාල නියමයක් නැති ව මල් පිපෙන ශාකයක් වන්නේ,
    1) කොහොඹ ය.    2) පොල් ය.    3) එරබදු ය.

30. අධික තිත්ත රසැති ශාක පත්‍රයක් වන්නේ,
    1) කොහොඹ    2) කරපිංචා    3) කරවිල

31. **'පනාමල්'** හටගන්නේ,
    1) පොල් ගසේ ය.    2) තල් ගසේ ය.    3) කොස් ගසේ ය.

32. ශාක කඳන්වල නිතර ගැවසෙන කෘමි සතෙකි.
    1) පත්තෑයා    2) රැහැයියා    3) සලබයා

33. නිශාචර පක්ෂියෙකු නොවන්නේ,
    1) බස්සා ය.    2) වටුවා ය.    3) උලමා ය.

34. අඳුර ප්‍රිය කරන කෘමි සතෙකි,
    1) කැරපොත්තා    2) සමනලයා    3) සබලයා

35. ශක්තිජනක ආහාර කාණ්ඩයට අයත් නොවන ආහාරයක් වන්නේ,
    1) බත් ය.    2) කැරට් ය.    3) දොදොල් ය.

36. ශරීරය වර්ධනය වීමට බෙහෙවින් උපකාරීවන ආහාර කාණ්ඩය තෝරන්න.
    1) මස්, මාළු, සෝයා බෝංචි    2) මස්, තලප,රොටි    3) මාලු, පරිප්පු, පලාවර්ග

37. අලුත උපන් බිළිඳා ට සුදුසු ම ආහාරය මෙයින් කුමක් ද?
    1) එළවලු සුප්    2) පිටි කිරි    3) මව්කිරි

38. ඉතා කෙටි කාලයකින් නිතර නිතර අස්වැන්න නෙළීමට හැකි ශාකයකි.
    1) බණ්ඩක්කා    2) කොස්    3) කෙසෙල්

39. ජලයේ හොඳින් දියවන , නැවත රත්කළ විට වෙනස් කර ගත නොහැකි ද්‍රව්‍ය වන්නේ,
    1) සීනි ය.    2) ලුණු ය.    3) විනාකිරි ය.

40. ඇඹුල් මිශ්‍ර ආහාර වර්ග පිසීමේ දී වඩාත් සුදුසු භාජන වන්නේ,
    1) තඹ භාජන ය    2) මැටි භාජන ය.    3) ඇලුමිනියම් භාජන ය.

41. සමාජයේ යහ පැවැත්මට ඉවහල්වන උපදෙස් ඇතුළත් කවි පොතකි.
    1) සුදෝ සුදු    2) සිරිත් මල් දම    3) අඹ යහළුවෝ

42. තැපැල් කාර්යාලයකින් ලබා ගත නොහැකි සේවාවකි,
    1) මුදල් ඇණවුමක් මාරු කර ගැනීම.
    2) විදුලි බිල්පතක් ගෙවීම.
    3) නැති වූ හැඳුනුම්පතක් ලබා ගැනීම.

43. උණුවතුර භාජනයකට අත පිළිස්සුණු විට මුලින් ම කළ යුත්තේ,

1) සිසිල් රෙදි කඩකින් එතීම
2) කෝමරිකා තැවරීම
3) ගලා යන ජලයට අත අල්ලා සිටීම

44. ඔබ ජීවත්වන ප්‍රදේශයේ බෝවන රෝගයක් පැතිරී යන්නේ නම් ඒ බව දැනුම් දිය යුත්තේ,

1) පොලිස් ස්ථානාධිපතිවරයාට
2) මහජන සෞඛ්‍ය පරික්ෂකවරයාට
3) ග්‍රාම නිළධාරි වරයාට

45. පිළිවෙළට හා පිරිසිදුව සිටිමෙන් සිසුවෙකුට ලැබෙන වාසියකි.

1) ලෙඩ රෝග වැළදීම.
2) අන් අයගේ ප්‍රශංසාවට ලක්වීම .
3) යහළුවන් අතර කොන්වීම.

46. සුළං හමන දිශාව දැනගනු ලබන්නේ ,

1) අනිල මානයෙන් 2) සුළං පෙත්තෙන් 3) සුළං දිශා දර්ශකයෙන්

47. ''**විරිත්**'' ලෙස හඳුන්වනු ලබන්නේ,

1) අප විසින් කළ යුතු යහපත් ක්‍රියා ය.
2) අප විසින් අත්හළ යුතු අයහපත් ක්‍රියා ය.
3) අප විසින් ඉටු කළ යුතු වගකීම් ය.

48. යහපත් දරුවෙකු සතු ලක්ෂණයකි.

1) ශබ්ද නගමින් ආහාර ගැනීම.
2) වැඩිහිටියන් දුටු විගස අසුනින් නැගිටීම.
3) නරක වචන කියමින් බැන වැදීම.

49. පියනකින් නොවසා පිසිනු ලබන ආහාරයකි,

1) කොස් 2) මඤ්ඤොක්කා 3) බතල

50. කොවිඩ් 19 රෝගය පැතිරීම සීඝ්‍රයෙන් ඉහළ යාමට හේතුවකි,

1) මුඛ ආවරණ පැළඳීම.
2) නිසි ලෙස දෑත් සේදීම.
3) සෞඛ්‍ය නීති - රීති පිළිනොපැදීම.

51. පදික මාරුවක දී කොළපාට වර්ණයෙන් යුත් මිනිස් රූපය දිස්වේ නම්,

1) පාර හරහා මාරු වීම නොකළ යුතු ය.
2) රථය ගමනට සූදානම් කරගත යුතුය.
3) පාර හරහා මාරු විය යුතු ය.

52. නැවුම් බිත්තරයක් රූපයේ පරිදි පාවෙන්නේ කුමක් මිශ්‍ර වූ ජලයේ ද?



1) දෙහි
2) කහ කුඩු
3) ලුණු

53.  මෙම රූපයෙන් දැක්වෙන්නේ,

1) නිදහස් අධ්‍යාපනයේ පියා ය.
2) බත් දුන් පියා ය.
3) පොත් දුන් පියා ය.

54. රාජ්‍ය ලාංඡනයේ ස්වයංපෝෂිත බව සශ්‍රීකත්වය පෙන්නුම්කරන සංකේතය වන්නේ,

1) ඉර හඳ 2) පුන්කලස 3) වී කරල්වලින්


55. ආරක්ෂාව සඳහා කටුවක් ඇති සත්ත්ව යුගල වන්නේ,

1) ගොළුබෙල්ලා - කටුවල්ලා
2) ඉබ්බා - කිඹුලා
3) ඉබ්බා - ගොළුබෙල්ලා

56. ශරීරය ලිහිල් ව තබාගෙන හුස්ම ඉහළට ගන්න පහළට හෙළන්න. මෙය සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ,


1) ශාරීරික ලිහිල් බව 2) මානසික ලිහිල් බව 3) අධිෂ්ඨානය

57. රූපයේ දැක්වෙන බල්බය



1) දැල්වේ.
2) නොදැල්වේ.
3) කිව නොහැක.

57. මෙම ඇණය ගැළවීම හා සවි කිරීම සඳහා යොදාගනු ලබන්නේ,



1) අඬු මිටිය
2) සාමාන්‍ය ඉස්කුරුප්පු නියන
3) මල් ඉස්කුරුප්පු නියන

58. **"සුන්දර උදෑසනක්"** යන මාතෘකාව යටතේ වචන පහකට වැඩි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි අර්ථවත් වාක්‍ය තුනක් ලියන්න.

1. ........................................................................................................

........................................................................................................

2 ........................................................................................................

........................................................................................................

3. ........................................................................................................

........................................................................................................